# තනි පද-15

වචන කිහිපයක් වචනුවට වයදිය හැකි තනි වචන තනි පද නම් වේ .

උදා :- අනුන් ගැන සිතන්නා - පරාර්ථකාමී

281) ලියැද්දකින් ලියැද්දකට ජලය බසින තැන - වක්කඩ

282) රටෙහි වාසය කරන්නා - රැටියා

283) අශ්වයා කරන නාදය - හේෂාරාවය

284) රජුට අවවාද අනුශාසනා කරන්නා - පුරෝහිතයා

285) දිනපතා කරන වැඩ කොටස - දිනචරියාව

286) වැඩිහිටි, ගුරුවරු කියන දේ නොකරන - අකීකරු

287) අනුන් කරන දේ බලා තමා ද කිරීම - අනුකරණය

288) තම රටට විරුද්ධව ක්‍රියා කරන්නා - දේශ ද්‍රෝහියා

289) දොරටුව මුර කරන්නා - දොරටුපාලයා

290) යුද්ධ කිරීමට ඉතා දක්ෂ - රණශූර

291) ඇතා විසින් කරන නාදය - කුංචනාදය

292) කුරුල්ලන් කරන නාදය - කූජනය

293) විද්‍යාව හොඳින් දන්නා තැනැත්තා - විද්‍යාඥයා

294) පොත් කියවීමට ඉතා ලැදි තැනැත්තා - පොත්ගුල්ලා

295) කළ ගුණ නොසලකන - ගුණමකු

296) අපරාධයක් කිරීමට රහසේ කරන කතා බහ - කුමන්ත්‍රණය

297) ගසක ඵල හට නොගන්නා කාලය - අවාරය

298) යමක් පාවිච්චි කරන තැනැත්තා - පාරිභෝගිකයා

299) සංගීත භාණ්ඩ පහකින් නිකුත් කරන නාදය - පංචතූර්ය නාදය

300) තාරුකා ගැන පර්යේෂණ කරන්නා - තාරකා විද්‍යාඥයා